


# ශ්‍රීපාලී දිනිතී කුලරත්න

# බදුලු කෝච්චියෙන් එන්න...

ශ්‍රීපාලී දිනිතී කුලරත්න

# බදුලු කෝච්චියෙන් එන්න..


ශ්‍රීපාලී දිනිතී කුලරත්න

කතෘ



පළමු දිගහැරුම...

ISBN : 978-624-208-570-8



සීවලී නවෝද්‍යා මහා විද්‍යාලය

බණ්ඩාරවෙල

3A ශ්‍රේණිය



08.02.2025

# පිදුම

මගේ ආදරණීය

අම්මාට,

අප්පච්චීට,

ආත්තම්මාට,

අයියාට සහ

නුවන්දරා ගුරුතුමියට

මෙම පොත ආදරයෙන් පුද කර සිටිමි.......

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවදිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම එයට සම්බන්ද කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදීකතෘ කරදන අත්තදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන “හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය හා ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවදියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිපලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය,

මහනුවර.

# බදුලු කෝච්චියෙන් එන්න....



අපේ ගෙදර තියෙන්නේ කුඩා කඳු ගැටයක් උඩ. ගෙදරට කොළඹ බදුල්ල පාර හොඳට පේනවා. සති අන්තයට නිවාඩු දවස් වලට වාහන තදබදය හරිම වැඩියි. ඉතිං අයියයි මමයි පාරේ එක දිගටම හෙමින් ඉස්සරහට ඇදෙන වාහන දිහා බලාගෙන ඉන්නවා.

" සුදු පුතා.." ඒ අප්පච්චිගේ හඬ

අපි දෙන්නම අප්පච්චි ළඟට දිව්වා.

“ හෙට උදේට කොළඹ විමල් මාමලා අපේ ගෙදර එනවා, ඇවිදින්න යන්න. ” අප්පච්චි එහෙම කියනකොට මට ගොඩක් සතුටු හිතුනා. විමල් මාමාගේ දුව මනුලි මගේ වයසමයි.

“ අපි හෙට උදේ කෝච්චිය එන වෙලාවට එයාලව මුනගැහෙන්න ඇල්ල නගරයට යන්න ඕනි. එයාලත් එක්ක අපිට ඇවිදින්න යන්නත් පුලුවනි ”.

අප්පච්චි කියනකොට මට හරිම සතුටු හිතුනා.

“ අප්පච්චි... විමල් මාමලා ඇවිදලා අපේ ගෙදරටත් එනවා ද ? ”

“ ඔව් දුවේ....”

එයාලා හෙට රෑට අපේ ගෙදර ඉඳීවි. මම මේ එයාලට කන්න කැවිලි ටිකක් හදන්නයි යන්නේ. අම්මා එහෙම කියන ගමන් කුස්සියට ගියා. අප්පච්චි අයියත් එක්ක ගේ අස් කලා. ගෙවත්තෙන් කඩපු මල් වලින් ගේ හැඩ කලා. අද අපේ ගෙදර හරිම කලබලයි.

මම මනුලිත් එක්ක ඇතිවෙනකම් සෙල්ලම් කරන්න හිටියේ හරිම නොඉවසිල්ලෙන්. මනුලි ආවම සෙල්ලම් කරන හැටි, කතා කරන දේවල්, බලන්න තියෙන දේවල් ගැන හිතුවා. එතකොට මට දන්නේ නැතුවම නින්ද ගිහින්.

“ චූටි දුව... නැගිටින්න නැගිටින්න...” අම්මා කතා කරන හඬ ඇහුනේ දුරකින් වගේ .

උදේට තියෙන හීතල, කම්මැලිකම නිකන්ම අමතක වුණා. අපි අද යන ගමන ගැන හිතලා. අපි කෑම බීම සේරම අරගෙන ඇල්ල දුම්රියපොලට යන්න පිටත් වුණා. අපිට එතනට යන්න වැඩි දුරක් නෑ.




කොළඹින් එන කෝච්චිය අද ටිකක් පරක්කුයි ලු.

අප්පච්චි අම්මට කිව්වා. අයියයි මමයි දුම්රියපොල ඉස්සරහ තියෙන බංකුවේ වාඩිවුණා.

“අද කෝච්චිය එන්නේ නැති වෙයි ද ? ”

මම දුකෙන් අයියාගෙන් ඇහුවා.

එතකොටම කෝච්චිය හූ කියන හඬ ඇතින් ඇහුනා. කඩිගුලක් වගේ කට්ටිය කලබල වුණා. අප්පච්චි ඉක්මනටම ගේට්ටුව ළඟට ගියා. අයියයි මමයි අම්මා ළඟට දිව්වා.

“ කොළඹ කොටුව සිට දැන් පැමිණෙන දුම්රිය තව ස්වල්ප මොහොතකින් වේදිකාවට ලඟා වනවා ඇත ”

ශබ්දවිකාශනයෙන් තවත් මොනවදෝ කියනවා ඇහුනා..

මට නම් දැන් ටිකක් ලැජ්ජයි වගේ. මම අයියගේ අත අල්ලගෙන හැංගුනා.

මනුලියි , විමල් මාමායි , සනුලි අක්කයි , ඒ නැන්දයි කෝච්චියෙන් බැහැලා වේදිකාවට එනකොට අප්පච්චි ගිහින් එයාලව පිළිගත්තා. මනුලිත් මං වගේම අම්මගේ ඇඟේ එල්ලිලා හැංගි හැංගි බලනවා මම දැක්කා.

එයාලා අප්පච්චිත් එක්ක බඩු බෑග් අරගෙන අපි ඉන්න තැනට ආවා.

“ ආනේ, දැන් පුතාගේ උස. දුවනම් හිටියා වගේමයි. ”

ලක්ශිකා නැන්දා එහෙම කිව්වා.

අයියයි මමයි නැන්දටයි මාමාටයි වදිනකොට , මනුලියි අක්කයි දෙන්නත් අපේ අම්මලාට වැන්දා.

ආ ගිය තොරතුරු කතා කරමින් අපි වාහනයට ආවා. අප්පච්චි දන්න තැනකට මනුලිලා එක්කගෙන ආවේ

එයාලට ටිකක් මහන්සි නිවාගන්න. අපි එහිදි උදේ කෑම කෑවා.

" හරි දැන් අපි යමු අපේ ගමනේ පළවෙනි තැනට. ඒ තමයි **ආරුක්කු නවයේ පාලම.** එතන බලන්න යන්න පාරවල් ගොඩාක් තියෙනවා. මම කැමතියි ඔයාලව බදුල්ල කොළඹ කෝච්චි පාර දිගේ එක්කගෙන යන්න. "

අප්පච්චි එහෙම කිව්වේ ගමනට සූදානම් වෙමින්.

අවශ්‍ය දේවල් අරගෙන අපි ගමන යන්න පටන් ගත්තා.

" අපේ පළාතේ විතරක් හැදෙන පුංචි පුංචි පැළෑටි වර්ග ගොඩාක් ඔයාලට දකින්න පුලුවන්." කියලා අම්මා කිව්වා.

පුංචි අපි හරීම සතුටින් ගමන ඉදිරියටම ගියා. ඈතින් බිංගය පේන්න ගත්තා.

" ඔය බිංගයට එහා පැත්තෙන් තමා ඒ නිර්මාණය තියෙන්නේ. " අප්පච්චි කියන කොටම,

" දැන්නම් හරිම මහන්සියි නේද ? පාලම පේන තැනකට ගිහිල්ලා වාඩි වෙමු ද ? "කියලා මනුලිගේ අම්මා ඇහුවා.

"හොඳ අදහස.. අපි පාලම උඩටම ගිහිල්ලා ගිමන් හරිමු"

විමල් මාමා කිව්වා.



“ මාමේ.... දැන් කෝච්චිය එන වෙලාව හරි ද ? කෝච්චිය එන්නේ කීයට ද ? ” මනුලි ප්‍රශ්න ගොඩක් අහගෙන ගියා.

හැබැයි අප්පච්චිට කලින් උත්තර දුන්නේ මනුලිගේ අක්කා සනුලි.

“ අක්කේ.. ඔයා කොහොමද ඒක හරියටම දන්නේ ? ”

මනුලි ඇහුවේ පුදුමයෙන්.

“ මම ඒක දැක්කේ අතන තියෙන දැන්වීම් පුවරුවෙන්. ”

සනුලි අක්කා කිව්වා.

අපි දැන් ඉන්නේ ආරුක්කු නවයේ පාලම උඩ. හරිම අපූරු නිර්මාණයක්.. අපි හැමෝම එතන අසිරිය වින්දා.

එතන වාඩි වෙලා හිටපු කට්ටියක් එතනින් අයින් වෙච්ච නිසා අපි ඉක්මනට එතනින් වාඩි වුණා.

අම්මා හදාගෙන ආව රසම රස කෑම අපි හැමෝම හරිම සතුටින් රසවින්දා. ඒ අතර අප්පච්චි මේ පාලමේ කතාව කියලා දුන්නා.

“ ඉංග්‍රීසීන් කොළඹ බදුල්ල රේල් පාර හදන කොට යකඩ හිඟයක් ඇති වෙලා තියෙනවා. ඒ නිසා තමයි මේ නිර්මාණය ගලෙන් කරලා  කඳු දෙක යා කරලා තියෙන්නේ.”

අපි ඒ විස්තරේ අහගෙන ඉන්නකොට සුළඟට ගසාගෙන ආපු පොලිතීන් බෑගයක් අපේ ළඟට වැටුණා. ඒක දැකපු අයියා පොලිතීන් බෑගය ගෙන ළඟ තිබුන කුණු කූඩයට දැම්මා.

මනුලිගේ තාත්තා මනුලිටයි සනුලි අක්කටයි මෙහෙම කිව්වා. “ අර බලන්න දුවලා අයියා කොච්චර හොඳ

වැඩක්ද කරේ. අපිත් මේ වගේ දිරන්නේ නැති කසල වලින් පරිසරය අපවිත්‍ර කරන්න හොඳ නෑ. ”

මනුලිගේ තාත්තා දුන්න ඒ අවවාදය අපි හැමෝම පිළිගත්තා.

ඇතින් ඇහුන හූ හඬ නිසා පාලම උඩ හිටපු හැමෝම කෝච්චියට ඉඩ දෙන්න පාලමෙන් ඈත් උනා. එහෙම නොකරපු අයට පොලිස් මාමාලාගෙන් බැනුම් අහන්නත් සිද්ද වුණා.

වංගුවෙන් කෝච්චිය මතු වෙනකම් බලාගෙන හිටපු හැමෝම හිටියේ හරිම නොඉවසිල්ලෙන්. බදුල්ල පැත්තේ ඉඳලා ආපු උඩරට මැණිකේ කෝච්චිය ආරුක්කු නවයේ පාලම උඩින් යනකොට ඒකේ තිබ්බ ලස්සන තවත් වැඩි වුණා.මනුලිලාගේ පවුලේ හැමෝටම හරිම සතුටුයි.

“ මට නම් මේ අත්දැකීම කවදාවත් අමතක වෙන්නේ නැති වෙයි. ” සනුලි අක්කා කිව්වා.

කෝච්චිය බිංගය ඇතුලෙන්  පේන්නේ නැති වෙනකම් අපි බලාගෙන හිටියේ ඇස්පිල්ලමක්වත් නොගහ.

“ කට්ටිය එහෙනම් යමු නේ ද ? ආපු පාරවගේ නෙමෙයි අපිට යන්න තියෙන්නෙ කඳු නැගගෙන බොහෝම අමාරු පාරක.”

අප්පච්චි එහෙම කියනවත් එක්කම,

“ අයියෝ මාමේ අපි තව ටිකක් මෙතන ඉමුකො ” කියලා කිව්වේ මනුලි.

“ එහෙම උනොත් අපිට තව ගොඩාක් ලස්සන තැන් බලන එක මගඇරෙයි. යමු යමු කොහොමහරි කඳු නැගගෙන උඩටම යමු ” අපි හැමෝම මනුලිව දිරිමත් කළා.

ආරුක්කු නවයේ පාලම බලලා ආපු අපි අපේ ඊළඟ තැනට යන අතරම ආගිය විස්තර කතා කළා. ඒක හරි අපූරු කාලයක් වුණා.

අපි ඇල්ල නගරය පහුකරලා ඌව පළාතේ තියෙන තවත් ලස්සන දිය ඇල්ලක් බලන්න ආවා. ඒ තමයි **රාවණාඇල්ල දියඇල්ල.** වාහනෙන් බැහැපු අපි දුර ඉඳන්ම දැක්ක සුදුම සුදු දිය ඇල්ලේ පාමුලටම යන්න පටන් ගත්තා.

“ මම දියඇල්ලක් ළඟට කවදාවත් ඇවිල්ලා තිබුනේ නෑ... ” මනුලි කිව්වේ හරිම සතුටින්.

“ පහුගිය දවස් වල තිබ්බ වැස්ස නිසා දියඇල්ලේ වතුර වැඩි වෙලා. අවදානමත් වැඩි නිසා දැන් ළඟට යන්නේ නැතුව ඉන්න එක් තමා ගොඩක්ම හොඳ..”

අපේ අම්මා කිව්වා. ඒක හැමෝම අනුමත කළා.

අයියා එයාගෙ කැමරාවෙන් අපි හැමෝගෙම ලස්සන ඡායාරූප කිහිපයක්ම ගත්තා.

“ දැන් අපි යන්නේ **පුංචි සිරීපාදය** බලන්න.” එහෙම කියනකොටම මනුලිගේ අක්කා පුදුමෙන් අප්පච්චි දිහා බැලුවා.

“ ඈ මාමේ.. අපිට පුලුවන් ද එතනට යන්න ? ” එයා ඇහුවේ පුදුමයෙන්.

“ ඔව් මට දුවලගේ තාත්තා කිව්වා, ඔයාලා එතනට යන්න හරිම ආසාවෙන් ඉන්න බව. අපිට ඕනි උනේ ඔයාලව පුදුම කරවන්න.” කියලා අප්පච්චි කියනකොට සනුලි අක්කා එයාගේ තාත්තාව ආදරයෙන් බදාගත්තා.

රාවණාඇල්ල දාලා එන්න මනුලි කැමති වුනේම නෑ.

" අපි ආයෙත් දවසක  ගොඩක් දවස් මෙහෙ නතර වෙන්න එමු." මනුලිගේ තාත්තා එයාට පොරොන්දු වුණා.

රාවණා ඇල්ල පහුකරලා එනකොට එක  තැනක අප්පච්චි වාහනය නතර කළේ එකපාරටම..

" ඇයි.. ඇයි... මොකක් හරි ප්‍රශ්නයක් ද ?"

හැමෝම කලබල වුණා.

" නෑ.. නෑ.. කට්ටියම කලබල වෙන්නෙ නැතුව හිමීට අන්න අර  තියෙන කපොල්ල දිහා බලන්නකෝ..."

අප්පච්චි එහෙම කියනකොටයි අපි ඒක දැක්කේ.

ඒ තමයි ඇල්ල කපොල්ල.

මග දිගට තියෙන ලස්සන තැන් බල බල වාහනය හිමින් ඇල්ල නගරයට ලඟා වුණා.

අපිට ආපු පොඩි පොඩි බඩගිනි වලට පුංචි පුංචි කෑම වර්ග කකා අපි කතාවෙන්ම පුංචි සිරීපාදෙට ළං වුණා.

" තාත්තෙ, අපේ පන්තියේ සිංහල අච්චු පොතේ පුංචි සිරීපාදය හැදුන හැටි ගැන හරිම ලස්සන ජනකතාවක් තියෙනවා."

පුංචි සිරීපාදේ බලන්න නොඉවසිල්ලෙන් හිටපු සනුලි අක්කා කිව්වා..

" අනේ අක්කේ.. අපිටත් ඒ කතාව කියලා දෙන්නකෝ."

මමයි මනුලියි සනුලි අක්කට කරදර කරන්න ගත්තා.

" හා..හා.. පොඩ්ඩක් ඉන්නකෝ. මම ඒක ඔයාලට පුංචි සිරීපාදෙ නගින ගමන් කියන්නම්කෝ.."

සනුලි අක්කා අපේ හිත හැදුවා.

අපෙ අම්මයි ලක්ශිකා නැන්දයි කන්ද නගින්න අදිමදි කරපු නිසා අපි විතරක් කන්ද නැග්ගා. ඒක හරිම වීර චාරිකාවක්. ඇත්ත සිරීපාදෙත් මේ වගේම තමයි කියලා විමල් මාමා කියනකොට අපිට හරිම සතුටු හිතුණා.



සනුලි අක්කගේ කතාව ඉවර වෙනකොට අපි හිටියේ පුංචි සිරීපාදේ උඩ.

ටික වෙලාවකට අපි හැමෝටම හිතුනේ අපි ඉන්නේ අහසේ කියලා. ඒ තරමටම ලස්සනයි. පුංචි සිරීපාදේ කන්ද උඩට ගොඩක් දුර තියෙන කඳු පංති පෙනුණේ හරියට චිත්‍රයක් වගේ.

ටික වෙලාවක් යනකම් ඒ අසිරිය වින්ද අපි හිමිහිට පහලට බැස්සා. අම්මලා හිටිය තැනට ඇවිත් වාඩි උනා.

" දවල් කෑම කන්න වෙලාවත් හරිනේ ද ?"

අප්පච්චි එහෙම අහනකොට තමයි අපිටත් බඩගින්න මතක් උනේ.

ඉක්මනටම අත් හෝදාගත්ත අපිට අම්මා ගෙදරින් එනකොට අරගෙන ආපු කෑම පාර්සල් ටික දුන්නා. කෙසෙල් කොලේ ඔතලා තිබ්බ කෑම ටිකේ ඒ වෙනකොටත් රස්නේ ගිහින් තිබ්බේ නෑ. කෙසෙල් කොලවල ඔතලා තිබ්බ ඒ කෑම හරිම රසයි. මගේ හොඳම යාලුවත් එක්ක කාලෙකින් එකට කන්න ලැබුණු ඒ කෑමවේල මටනම් කවදාවත් අමතක වෙන එකක් නම් නෑ.

" හ්ම්ම්... නැන්දාගේ බත් එකේ සුවඳ, පාට, රස හරි හරියට..." එහෙම කිව්ව මනුලිගේ කතාවට හැමෝම හිනා වුණා.

“ කෑම නම් හරි දැන් ඉතින් මහන්සියට නිදා ගන්න තිබ්බොත් හොඳයි” එහෙම කිව්වේ සනුලි අක්කා.

“ නෑ පුතේ, මාමා අපිව තව තැන් ගොඩකට එක්කගෙන යන්න නේ ඉන්නේ.. අපි දැන් පිටත් වෙමු.” විමල් මාමා එහෙම කිව්වා.

කෑම කාපු තැන් අස් කරපු අපි එතනින් එන්න පිටත් වුණා.

ඇල්ල නගරය පහු කරගෙන ඉස්සරහට යනකොට පාරෙ හිටපු සංචාරකයන්ට අත වනන එක මනුලිටයි මටයි අපූරු සෙල්ලමක් වුණා.

ඇල්ලට ඉස්සර කියලා තියෙන්නෙ ‘නිදන නගරය’ කියලා. ඇල්ලේ තියෙන හොඳ වාතය, ලස්සන වටපිටාව, මීදුම බලන්න එන සංචාරකයෝ නිසා දැන් ඇල්ල සංචාරක පුරවරයක්.

මෙහෙම එන අතරතුර අපිට විමල් මාමා අතුරුපසට අයිස්ක්‍රීම් අරන් දුන්නා. මමයි මනුලියි අයියයි අක්කයි ඒවා කෑවේ තරහෙට.

පාර දිහට නතර කරලා තිබුණු බස් පේළියක් නිසා වාහනයේ  වේගය අඩු  වුණා. අපි දැන් පල්ලම් බහින්නේ හෙමිහිට. දැන්නම් ටික ටික මිදුම අපිව වට කරන්න පටන් අරන්.

අප්පච්චි වාහනේ හිමිහිට පාරෙන් ඉවතට ගත්තා.

මමනම් දැනගෙන හිටියා අප්පච්චි කරන්න යන දේ.

"කට්ටිය හෙමින් බැහැලා අයිනට එන්නකෝ." අප්පච්චි කිව්වා.

අයිනට ආපු අය වටපිට බලන කොට ඇස් එක තැනක නතර වුණා.

" ආනේ... පිංතූරවල දැක්කා වගේමයි. ඇස් අදහාගන්නත් බෑ."  හැමෝම ගල් වෙලා වගේ බලාගෙන හිටියා.

" මේ තමයි **කුඹල්වෙල මහමෙව්නා අසපුව.** " අම්මා කිව්වා.

" අපේ අම්මා ආසාවෙන් එන්න හිතාගෙන ඉන්න තැනක්." ලක්ශිකා නැන්දා කිව්වේ දුකෙන්.

" හරි.. හරි.. අපි ආයෙත් එනකොට අත්තම්මවත් එක්කගෙන එමුකෝ." විමල් මාමා එයාව සනසව්වා.

“ අම්මෝ එච්චර උසකට අපි යන්නේ කොහොම ද ?”

සනුලි අක්කයි, මනුලියි දෙන්නා එකපාර ඇහුවා.

“ මම පුතාලව එක්කගෙන යන්නම් කෝ.. දැන් අපි ගෙදර ගිහිල්ලා පොඩි විවේකයක් අරගෙන ඉමු .” අප්පච්චි කියනවත් එක්කම අපි වාහනයට නැග්ගා.

දවස පුරාම ලොකුම ලොකු රවුමක් ගිහින් ගෙදර ආපු අපි හැමෝටම දැන්නම් ගොඩක් මහන්සියි. අපි ඉක්මනටම මූණ සෝදාගත්තා..

“ කොළඹ වගේ නෙමෙයි. මෙහෙ හවසට සීතලයි. ඒක නිසා ඇල් වතුරෙන්නම් නාන්න එපා”

අම්මා අපේ ආගන්තුකයොන්ට එහෙම අවවාද කළා.

මනුලියි මමයි අක්කයි මගේ කාමරයට ගියා. වැඩිහිටියො පරණ කතා කිය කිය හිටියා

සනුලි අක්කා අපේ පොත් රාක්කෙන් පොත් තෝරන්න ගත්තා.

ටිකක් වෙලා විවේක ගත්ත අපි, තේ බිබී  පරණ කතා කිය කිය ඉන්න කොට  රෑ වෙනවා දැනුනෙවත් නෑ.

“ දැන් පුතාලා අසපුවේ යන්න ලෑස්ති වෙන්න. ජර්සි , තොප්පිත් ගන්න.” අම්මා කිව්වා..

රෑ කෑම හදන්න ඕනි නිසා අම්මා ගෙදර නතර වුණා.

මීදුමත්, චිරි චිරි වැස්සත් එක්කම අපි අසපුවට යන්න පිටත් වුණා.

ඒ යන අතරමගදි තෙල්, මල්, හඳුන්කූරු ගත්තේ විමල් මාමා.

රෑ කලුවරයි, ලයිට් වල එළියයි නිසා ඒ වෙලාවේ අසපුව පෙනුණේ හරියට කතාවල තියෙන දිව්‍යලෝකයක් වගේ.



අපි හැමෝම පන්සල වැඳපුදා ගත්තා.

එළිමහනට ගියපු අපිට කලුවරේ වුනත්  අවට වටපිටාව හරිම ලස්සනට පෙනුණා.

ඈත කඳු දිහාව බලාගෙන හිටපු සනුලි අක්කා අන්න කෝච්චියක් යනවා කියලා කෑගැහුවේ අපි ඉන්නේ පන්සලක කියන එකත් අමතක කරලා.

ගොඩක් රෑ වෙනකම්ම අසපුව වැඳගත්ත අපි ගෙදර එන්න පිටත් වුණා.

අම්මාගේ රසම රස රෑ කෑම වේල මේසේ උඩ තිබුණේ දුම් දමමින් .

හෙට උදේට මනුලිලා යන්න ඕනි කියලා මතක් වෙද්දී මට ගොඩක් දුක හිතුනා.

" අම්මේ , අපිට හෙට දවසත් මෙහෙ ඉන්න බැරි ද ? "

සනුලි අක්කා කෑම කන ගමන් ඇහුවා.

" බැහැනේ පුතේ, තාත්තට නිවාඩු නෑ නේ. අනික, අපි දවල් කෝච්චියෙන් ගියොත් තමයි බදුලු ගමනේ ලස්සන බලන්න පුලුවන් වෙන්නේ."

නැන්දා එහෙම කිව්වෙ ටිකක් විතර දුකින් කියලා මට හිතුණා.

රෑ කෑමෙන් පස්සේ ගමන ගැන අපි සතුටින් කතා කළා.

"දැන් නිදියන වෙලාවනේ මගෙ පුතාලා, හෙට උදෙන්ම නැගිටින්න ඕනි නිසා දැන්ම නිදා ගත්තොත් හොඳයි"

අප්පච්චිගේ කීම අහපු මම මනුලිවයි සනුලි අක්කවයි එක්කගෙන නිදාගන්න ගියා.

උදේ නැගිටිනකොට අම්මා මනුලිලාට අරගෙන යන්න කෑමත් ලෑස්ති කරලා.

උදේ කෑම කාපු අපිට,  සමුගන්න වෙලාව ආවා. විමල් මාමයි, ලක්ශිකා නැන්දයි, මනුලියි, අක්කයි, අම්මටයි අප්පච්චිටයි ගොඩාක් ස්තූති කළා.

ඊළඟ පාසල් නිවාඩුවට අනිවාර්යයෙන්ම එනවා කියලා විමල් මාමා  පොරොන්දු වුනේ මම අඬනවා දැක්ක නිසා වෙන්න ඇති.

උදේ 10.30 ට බණ්ඩාරවෙලින් කෝච්චියට නගින්න කට්ටියම ගෙදරින් පිටත් වුණා.

"  ආයෙත් දවසක **බදුලු කෝච්චියෙන් එන්න**"

එහෙම කියපු මම අම්මට තුරුළු වුණා........

නිමි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණ විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ත ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්තකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත් සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතු ය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්තකාරී මෙන්ම සමාජය තුල විවිධ ගැටලු, ප්‍රශ්න නිර්මාණය වී ඇති බව පර්යේෂණාත්මක ව සනාත වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්.